**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි ශේෂ පිරික්සුම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් සඳහා දරන ලද වියදම් රු.මිලියන 611.96 ක් විය යුතු නමුත්, මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 579.13 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය රු.මිලියන 32.83 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලනයෙන් තොර බව. | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ විධිවිධාන ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. |

**(ආ) දේපළ පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනය අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය රු.මිලියන 2,888 ක් වුවද, 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව මූල්‍ය නොවන වත්කම් වල ආරම්භක ශේෂය රු.මිලියන 2,805 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2023 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.මිලියන 83 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.මිලියන 83 ක් අඩුවෙන් ගිණුම්ගත වී ඇති අතර, එය ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | මූල්‍ය ප්‍රකාශන, පෙර වර්ෂයේ අවසන් ශේෂ සමඟ අනුරූපීව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු රු.මිලියන 111.35 ක් වටිනා (රක්ෂණය සඳහා තක්සේරු කළ) වාහන 40 ක් හා තවත් වාහන 08 ක වටිනාකම හා නිල නිවාස 52 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර, 2022 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනාගත් අපහරණය කළ යුතු භාණ්ඩ 2023 වර්ෂයේ අපහරණය කර ඇතත්, එම අපහරණය කරන ලද භාණ්ඩවල වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 05/2023 දරන චක්‍රලේඛයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සියලුම වත්කම් තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයෙහි වත්කම් අත්පත් කරගත් දිනය, අපහරණය කළේ නම් ඒ පිළිබඳ තොරතුරු, වත්කම් හුවමාරු කරගැනීම පිළිබඳ තොරතුරු, වත්කම් මිලදීගැනීම් තොරතුරු ඇතුළත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | CIGAS වැඩසටහන තුළ මිලදීගත් දිනය සටහන් වන අතර, ස්ථාවර වත්කම් අපහරණය හා හුවමාරු කර ගැනීම් විස්තර යාවත්කාලීන වීම සිදු වී නැති බවත්, එය ඉදිරියේ දී නිවැරදි කරන බව. | CIGAS වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2024 මැයි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 203.6 ක් විය. | පිළිතුරු කඩිනමින් ලබා දීමට සියලුම අංශ හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතුය. එසේ පිළිතුරු ලබා දිම ප්‍රමාද විය හැකි විමසුම් වෙනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ වැය විෂයයන් 07 ක් වෙත මාරු කරගත් ප්‍රතිපාදන රු.මිලියන 2.8 ක් වැය නොකර සියයට සියයක්ම සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරිවී ඇති අතර, වෙනත් වැය විෂයයන් 04 ක් වෙත මාරු කරගත් ප්‍රතිපාදන රු.මිලියන 5.2 කින් එකතුව රු.මිලියන 3.7 ක් එනම් එක් එක් වැය විෂයය යටතේ සියයට 60 ක සිට සියයට 97 ක් අතර පරාසයක ප්‍රතිශතයක් ඉතිරිව පවතින අතර, වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමෙන් ද පසුව පිළිවෙලින් සියයට 52 ක් හා සියයට 95 ක් අතර ප්‍රමාණයක් ඉතිරිව පැවතුණි. | අපේක්ෂිත පරිදි වියදම් දැරීම සඳහා වවුචර්පත් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | අයවැය ඇස්තමේන්තු මූල්‍ය කළමනාකරණ මඟපෙන්වීමක් වශයෙන් භාවිතා කළ යුතුය. |
| (ආ) | නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි මූලික සැලැස්මෙහි ප්‍රධාන අංගයක් වූ සූර්ය කෝෂ පද්ධතිය ඉදිනොකිරීම නිසා මාසික විදුලි උපයෝජනය වෙනුවෙන් රු.මිලියන 1 ත් | සෝලා පද්ධතියක් සවිකර විදුලි සැපයුම ලබාදීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය අපොහොසත් වූ බැවින් 2024 වර්ෂයේ දී | මූලික සැලැස්මෙහි වැදගත් අංශයක් වූ සූර්ය කෝෂ පද්ධතිය සවි කිරීම, ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කිරීමට ප්‍රථම අවසන් කිරීමට සැලසුම් කළ යුතුය. |

| | |
|---|---|
| රු.මිලියන 2 ත් අතර අධික වියදමක් දැරීමට සිදුවී තිබුණි. | ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 66 ක් එම සෝලා පද්ධතිය සවිකිරීමට යොදා ඇති බව. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 යල හා 2023 මහ කන්න වලදී පරිසර හිතකාමී පොහොර බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ගොවීන් වෙත කාබනික පොහොර ලබාදීමේ දී නිර්දේශිත කාලසීමාව තුළ භාවිතයට ගත හැකි ලෙස පොහොර ලබාදිය යුතු වුවත්, 2022 යල කන්නයේදී රු.මිලියන 298.1 ක් හා 2023 මහ කන්නයේදී රු.මිලියන 681.4 ක් වටිනා කාබනික පොහොර නිර්දේශිත කාල සීමාව තුළ හා නිර්දේශීත ප්‍රමිතීන්ට අනුකූලව නිකුත් කර නොතිබූ අතර, පුලස්තිගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවින් 211 ක් වෙත 2022 යල කන්නයේදී හා 2023 මහ කන්නයේදී බෙදාදීමට තිබූ රු.මිලියන 9.5 ක් වටිනා කාබනික පොහොර ගොවීන් විසින් රැගෙනයාම ප්‍රතික්ෂේප කිරීම මත විනාශ වෙමින් පැවතුණි. | පොහොර බෙදා හැරීම අදාළ වගාව ව්‍යාප්ත කළ දිනවලට සමගාමීව සිදුවූ බව. | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදි ආර්ථිකමය, කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයට අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | | | | |
| | II කාණ්ඩය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2020/06 චක්‍රලේඛය 3 වන ඡේදය | 300,000 | මෙම ඡේදයේ විධිවිධාන වලට පටහැනිව සමෘද්ධි ප්‍රජාමූල බැංකු 3 කින් රු.100,000 බැගින් එකතුව රු.300,000 ක ණය මුදලක් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක තනතුරේ වැඩ ආවරණයට පත්කර තිබූ අතිරේක දිස්ත්‍රික් ලේකම් විසින් ලබාගෙන තිබුණි. | පිළිතුරු ඉදිරියේදි ලබාදෙන බව. | චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව ගෙවීම් නොකළ යුතුය. |
| (ආ) | 2004 මැයි 11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.4 ඡේදය | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක මෙම චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව වැටුප් සකස් කිරීමේ මෘදුකාංගයේ මුරපදය තුන්මසකට වරක් වෙනස් කළ ද පැරණි මුරපදයෙන් පද්ධතිය වෙත පිවිසිය හැකි බව. | පද්ධති දුර්වලතාවය ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | පද්ධති දුර්වලතාව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2009 මැයි 06 දිනැති අංක 1600/18 හා 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය | | රජයේ ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය කැණීම් ගාස්තු එකතු කිරීම් වශයෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අයවිය යුතු රු.මිලියන 139.55 ක මුදලක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක පවත්වාගෙන ගිය බලපත්‍රලාභී කළුගල් වැඩපොළවල් 41 කින් අයකරගෙන නොතිබුණි. | පිළිගෙන ඇත. | හිඟ ඛණිජ ද්‍රව්‍ය කැණීම් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**2.4** වංචනික ස්වරූපයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 යල කන්නයේදී පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් හරහා ගොවීන් වෙතින් වී මිලදී ගෙන, මිලට ගත් වී තොග සහල් කර නැවත රජය වෙත භාර දීමේ වැඩසටහනේදී දිඹුලාගල, තමන්කඩුව, ලංකාපුර, ඇලහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මිලට ගන්නා ලද වී සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ 2021 ජූලි 22 දිනැති අංක DFD/Paddy/2021-3 චක්‍රලේඛයේ 7(1) වගන්තිය ප්‍රකාරව රු.මිලියන 215 ක් වටිනා සහල් කිලෝ මිලියන 2.18 ක් රජයට ලබාදීමට වී මෝල් හිමියන් විසින් කටයුතු කර නොතිබුණි. | රටේ පැවති ආර්ථික ගැටළු තත්වයන් හමුවේ වී කෙටීම ගිවිසුම්ගත මිලට කළ නොහැකි බව වී මෝල් හිමියන් පවසා සිටි අතර, කෙසේ වුවද වී මෝල් හිමියන් වෙතින් හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2021 යල කන්නයේදී සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් 19 ක් හරහා ගොවීන් 294 ක් මඟින් වී ලබා නොගෙන, වී ලබාගත් බවට අධීක්ෂණ කටයුතු භාර සංවර්ධන නිලධාරීන් මඟින් අදාළ ආකෘති පත්‍ර සකස් කර, වී සඳහා රු.මිලියන 87.46 ක් හා ඇසුරුම් මලු හා වියලුම් කුලී ලෙස රු.මිලියන 7.68 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් මඟින් ගෙවීම් කර තිබුණි. | නිලධාරීන් විසින් වංචනික ක්‍රියාවන් සිදු කර නොමැති බවත්, ගොවීන්ට ව්‍යාජ මුදල් ගෙවා නොමැති බවත් දන්වා සිටින අතර, මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වා විනයානුකූලව පියවර ගැනීමට කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂණයක් පවත්වා විනයානුකූල පියවර ගත යුතුවීම. |
| (ආ) | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 ජූනි 11 දින සිට 2021 මැයි දක්වා කාලය තුළ වැඩිහිටි දීමනා හා වකුගඩු දීමනා ගෙවීම් කිරීමේදී සිදු වී තිබූ රු.මිලියන 2.44 ක මූල්‍ය අක්‍රමිකතාවය තහවුරු වී ඇති නමුත්, මේ සම්බන්ධයෙන් අදාළ | මූලික විමර්ශන වාර්තාව හා චෝදනා පත්‍රයේ කෙටුම්පත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති නමුත් ගත යුතු ක්‍රියාමාර්ග දක්වා එවා නොමැති අතර, මෙම නිලධාරියාගේ වැඩ තහනම් | අදාළ නිලධාරියාට සහ අධීක්ෂණ නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | |
|---|---|
| නිලධාරියාට විරුද්ධව මූලික පරීක්ෂණ වලින් පසු විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර අදාළ අධීක්ෂණ නිලධාරින්ට විරුද්ධව කිසිදු මූලික පරීක්ෂණයක් හා විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කරන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති බවද දක්වා ඇත. |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු තැම්පතු කාල විශ්ලේෂණය අනුව වටිනාකම රු.මිලියන 65.93 ක තැන්පතු වර්ෂ 5 ක් ඉක්ම වූ හා වටිනාකම රු.මිලියන 56.81 ක තැන්පතු වර්ෂ 2 ක් ඉක්මවා තිබුණි. | තැන්පතු සම්බන්ධයෙන් වරින් වර ආයතන දැනුවත් කරමින් සිටින බව දන්වා ඇත. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2023-2026 දක්වා වර්ෂ වෙනුවෙන් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඇති නමුත්, 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව තොරතුරු ඇතුළත් කර 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2020 අගොස්තු 22 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සකස් කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | 2020 අගොස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සකස් කළ යුතුවීම. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 2020 වර්ෂයේ ලද ප්‍රතිපාදන මත රු.මිලියන 10.90 ක ගිවිසුම් ගත වටිනාකමක් සහිත හිඟුරක්ගොඩ විදුලි වැට ආශ්‍රිත මුරකුටි 16 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 1.81 ක වියදමක් දරා ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීම හේතුවෙන් රජයට සිදුවූ අලාභය අවම කර ගැනීම සඳහා රු.845,137 ක කාර්යසාධන සුරක්ෂණය දිස්ත්‍රික් ලේකම් වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | , කාර්යසාධන සුරක්ෂණය මඟින් අයකර ගැනීමට අපහසු මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති බිල්පත් වලින් හා ඔහු විසින් සිදුකර ඇති වෙනත් ව්‍යාපෘතිවල රැඳවුම් මුදල්වලින් පියවා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | රජයට සිදුවූ අලාභය පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන මඟින් 2020 සැප්තැම්බර් 15 සිට 2021 නොවැම්බර් 07 දක්වා කාලය තුළ ඇලහැර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විදුලි වැට ආශ්‍රිත මුරකුටි 12 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 8.99 ක වටිනාකමකට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර, රු.මිලියන 2.64 ක වැඩ නිමකිරීමෙන් පසුව ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි. ඊට අදාළ කාර්යසාධන සුරක්ෂණය මඟින් රජයට සිදුවූ අලාභය අයකර ගැනීම සඳහා වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. | කාර්යය සාධන සුරක්ෂණය යාවත්කාලීන කිරීමට නොහැකිවූ බව. | රජයට සිදුවූ අලාභය පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන යටතේ දිඹුලාගල විදුලිවැට ආශ්‍රිත මුරකුටි 13ක් ඉදිකිරීම සඳහා 2020 සැප්තැම්බර් 18 සිට 2020 දෙසැම්බර් 15 දක්වා කාලය තුළ නිමකිරීමට රු. මිලියන 9.69 කට ගිවිසුම්ගත වී ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය 2023 ජනවාරි 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 5.05 ක වියදමක් දරා තිබුණද | කළ වැඩ සඳහා බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති බවත්, කොවිඩ් වසංගතය නිසා ව්‍යාපෘති නිම කර ගැනීමට නොහැකි වූ බවත්, එම ව්‍යාපෘති වෙනුවෙන් තවදුරටත් ප්‍රතිපාදන වෙන් නොවන බැවින් ව්‍යාපෘති තාවකාලිකව නවතා දමන ලෙස වනජීවී අධ්‍යක්ෂ | ව්‍යාපෘති ඉටුකිරීමේදී ඵලදායි ආකාරයට අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එහි කටයුතු අවසන් කර නොතිබුණි. | ජනරාල් විසින් 2022 ජුනි 22 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති බව. | |
| (ඇ) | රු.මිලියන 9.95 ක ප්‍රතිපාදන වෙන් කළ සිරිපුර බස් නැවතුම්පල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු දිනය 2021 දෙසැම්බර් 22 දින වුවද, විගණනය විසින් 2022 මාර්තු 10 දින භෞතික පරීක්ෂාව සිදුකරන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණු බැවින් ප්‍රමාද ගාස්තුව වශයෙන් රු.343,759 ක් හඳුනාගෙන තිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු නිවැරදි ප්‍රමාද ගාස්තු රුඳවුම් මුදල් වලින් අය කරගන්නා බවට 2022 ජුලි 07 දිනැති දිස්ත්‍රික් ලේකම්ගේ විගණන විමසුම සඳහා පිළිතුරු වශයෙන් දන්වා තිබුණද, එහෙත් ඒ අනුව කටයුතු නොකර ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව සිදුකර ඇති බවට දැක්වෙන වාර්තා සකස් කර සම්පූර්ණ ගෙවීම් සිදුකර තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාදවී ලැබීම හේතුවෙන්, සිදුවූ ප්‍රමාද ගාස්තු අයකිරීම සාධාරණ නොවන බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකළ යුතුවීම. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නැගෙනහිර අරලගංවිල ග්‍රාම නිලධාරි වසමේ මාර්ගයක් කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 1.97 ක වටිනාකමකට ගිවිසුම්ගත වී ඇතත්, අදාළ ව්‍යාපෘතිය රු.499,828 ක් වැයකර ABC යෙදීමෙන් පසු අත්හැර දමා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි. | 2024 ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට ඇතුළත් කර ඇති බව දක්වා ඇත. | ව්‍යාපෘතිය නිමකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හිඟුරක්ගොඩ බස් නැවතුම්පල ඉහල මහල ඉදි කිරීමේ ව්‍යාපෘති කටයුතු පිබිදෙමු පොළොන්නරුව රජරට නවෝදය සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදෙස් නොසලකා හැර ව්‍යාපෘති භාර නිලධාරින් කටයුතු කිරීම හේතුවෙන් තාක්ෂණික දෝෂ පැන නැඟ ඇති අතර, ඉහළ මහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා වැය කර ඇති රු.මිලියන 11.17 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි. | දිස්ත්‍රික් ඉංජිනේරුතුමාගේ ලිඛිත උපදෙස් පරිදි අදාළ වෙනස්කම් සිදුකර තිබුණු අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලයේදී රට තුළ පැවති අයහපත් වාතාවරණය මත ව්‍යාපෘති ඉදිකිරීම් ප්‍රමාද වූ බව හා උඩුමහල වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව තුළ අදාළ කාර්යය අවසන් කළ බවත්, සමස්ථ කාර්යය අවසන් කිරීමට තවදුරටත් ප්‍රතිපාදන අවශ්‍ය බව. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව හා ඵලදායි ආකාරයට අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා අදියර 02 ක් යටතේ ගිවිසුම්ගතව 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 1,030.84 ක් වියදම් දරා තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කරවා ගැනීම සඳහා දෙවන අදියර සඳහා සැපයුම්කරුවකු තොරා ගැනීම ප්‍රසම්පාදනයෙන් බැහැරව සිදුකර තිබුණද අපේක්ෂිත ඉදිකිරීම් කාලය අවුරුදු 05 කින් ප්‍රමාද වී තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සිදුකර ඇති බවත්, II වන අදියර 2020/2021 වර්ෂවලදී ඇති වූ කොවිඩ් වසංගතය නිසා මන්දගාමීව සිදු වී ඇති බව. | ව්‍යාපෘතිය ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව, ඵලදායි ආකාරයට අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | පිබිදෙමු පොළොන්නරුව රජරට නවෝදය සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 1,303.86 ක කොන්ත්‍රාත් වටිනාකමට පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත 2016 දෙසැම්බර් 15 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර, එම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 15 දින නිම කිරීමට සැලසුම් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉදිකිරීම් අවසන් කර භාර දී නොතිබුණි. | 2018 දෙසැම්බර් 15 දින ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතව තිබුණ ද, එය 2021 සැප්තැම්බර් 30 දක්වා කාලය දීර්ඝ කර ඇති නමුත් අරමුදල් නොමැති වීම මත ඉදිකිරීම් නතර වී ඇති බව. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිමකර ඵලදායිව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 මුදල් නිදහස් කර තිබූ නමුත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ විජයබාපුර විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1.73 ක් වියදම් දරා ඇතත්, එම ටැංකි තුළින් ජලය කාන්දු වීමෙන් සුරතල් මසුන් ජනනය කිරීමක් සිදුකළ නොහැකි බැවින් ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබුණි. | ඉදිකර ඇති ටැංකි 09 ක වතුර කාන්දුවීමක් පවතින බවත්, සුරතල් මසුන් ජනනයට සුදුසුවන සේ ටැංකි අස්කර වැඩිදියුණු කිරීමට ප්‍රතිපාදන ඉල්ලා යවා ඇති බව. | ව්‍යාපෘති ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව, ඵලදායි ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරා ගැනීමට හැකිවන ආකාරයට ඉටුකළ යුතුය. |
| (ආ) | 2022 ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ කිකිළි පැටවුන් ලබාදීමේ ව්‍යාපෘතිය මඟින් මිලට ගත් රු.මිලියන 10.84 ක් වටිනා කිකිළි පැටවුන් 26,837 ක් අතරින් රු.මිලියන 8.78 ක් වටිනා කිකිළි පැටවුන් 21,731 ක් මියයාම හේතුවෙන් රජයට සිදුවූ පාඩුව සම්බන්ධව සැපයුම්කරු විසින් කිකිළි පැටවුන් ලබාදීමට ගිවිසුම්ගත වී තිබුණද, අදාළ කිකිළි පැටවුන් 2024 මැයි මස වන විටත් ලබා දී නොතිබුණි. | එම මිය ගිය කිකිළි පැටවුන් වෙනුවට සැපයිය යුතු කිකිළි පැටවුන් 2024 මැයි 31 දින වන විට ලබාදෙන ලෙස දන්වා ඇති අතර, එදිනට අදාළ කිකිළි පැටවුන් සැපයීම පැහැර හැරියහොත් ගිවිසුම ප්‍රකාරව නීතිමය පියවර ගන්නා බව. | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

### 3.6 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|
| 2016 සිට 2020 කාල සීමාව තුළ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය විසින් ඉටුකළ ප්‍රමාණාත්මක අඩුපාඩු පවතින ව්‍යාපෘති 15 ක රැඳවුම් මුදල් ලෙස රු.මිලියන 141 ක් පවතින අතර අඛණ්ඩව අසාර්ථක හා අඩුපාඩු පවතින ව්‍යාපෘති ඉටු කරන මෙම ආයතන වෙත ඉදිරියේදී ව්‍යාපෘති ප්‍රදානය කිරීමට ප්‍රථම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු බව හෝ මෙම ආයතනය අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අධ්‍යක්ෂ(සැලසුම්) හා ප්‍රධාන ඉංජිනේරු සමඟ සාකච්ඡා කර තීරණ ගැනීමට නියමිත බව. | නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ව්‍යාපෘති ඉටුනොකරන ආයතන සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තමන්කඩුව හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාවිතා කරන බවුසර් 03 ක්, ට්‍රැක්ටරයක්, යතුරු පැදියක් හා පාපැදියක් වර්ෂ 02 කට අධික කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | එක් බවුසරයක් ලොරි රථයක් බවට පරිවර්තනය කිරීමට හා අනෙක් බවුසර් 02 ක ප්‍රතිපාදන ලද පසු අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බවත්, යතුරු පැදිය පවරාගැනීමට කටයුතු කරන බව. | නිෂ්කාර්යව පවතින දේපළ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.8 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000-2007 කාල සීමාව තුළ ආහාර දෙපාර්තමේන්තුව මගින් සහල් තොග ආරක්ෂණ කළමණාකරන වැඩසටහන යටතේ පොළොන්නරුව ආහාර ගබඩාවෙන් ලක් සතොස වෙත ලබාදුන් සහල් වෙනුවෙන් රු.මිලියන 22.31 ක් හා ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දුන් සහල් තොග වෙනුවෙන් රු.මිලියන 19.82 ක් ලෙස එකතුව රු.මිලියන 42.13 ක මුදලක් වසර 20 කට ආසන්න කාලයක් ගතවී ඇතත්, පියවීමෙන් තොරව හානි හා පාඩු ප්‍රකාශනයේ තවදුරටත් කපාහැරීමට ඇති ශේෂයක් ලෙස පෙන්නුම් කර ඇත. නමුත් මෙම ශේෂයන් උක්ත ආයතන දෙකෙහි මූල්‍ය ප්‍රකාශන තුළ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවීමට ඇති ශේෂයක් ලෙස ගිණුම් ගත කර නොමැති බව තහවුරු වී ඇත. | 7000-0-0-25003-418 අත්තිකාරම් ගිණුම යටතේ 2007 ජනවාරි 31 දිනට පැවති ශේෂය වන රු.මිලියන 2,076.33 කින් මේ වන විට රු.මිලියන 42.13 ක ශේෂයක් පියවා ගැනීමට ඉතිරිව ඇති බව. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇලහැර, තමන්කඩුව, මැදිරිගිරිය, ලංකාපුර, හිඟුරක්ගොඩ, වැලිකන්ද හා දිඹුලාගල යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 07 ක පිහිටුවා ඇති ග්‍රාම ශක්ති ජනතා සමිති 85 ක් අතරින් සමිති 61 ක් අක්‍රීය මට්ටමේ පවතින අතර, එම සමිති වලට අයත් ගිණුම් තුළ 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 16.37 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. | අරමුදල් ගිණුම් වල පවතින මුදල් සක්‍රීය මට්ටමේ පවතින සමිති වලට මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ අරමුණු ඵලදායී ලෙස ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ඇලහැර, මැදිරිගිරිය, ලංකාපුර හා හිඟුරක්ගොඩ ප්‍රදේශයන්ට අයත් රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, පාසල් හා විහාරස්ථාන පිහිටි ඉඩම් 511 කින් සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් පැවරුම් ඔප්පු නිකුත් කර ඇත්තේ ආයතන 122 ක් සඳහා පමණි. | රාජ්‍ය ආයතන වෙත පැවරුම් ඔප්පු ලබාදීමට කටයුතු කරමින් සිටින බව. | පැවරුම් ඔප්පු නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 04. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හි කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක පුරප්පාඩු 10 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු 16 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 07 ක පුරප්පාඩු 161 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු 2 ක් ලෙස පුරප්පාඩු 189 ක් පැවතුණි. | පුරප්පාඩු සියල්ල පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන PACTS පද්ධතියක් හරහා යාවත්කාලීන කරනු ලබන බව. | පුරප්පාඩු සම්බන්ධව කටයුතු කළ යුතුය. |